




සම්මානිත මහාචාර්ය
කුසුමා කරුණාරත්න

"බතත් ඉදී ලිප නිවී ගියා - මට තවත් බෑ තරහ වෙලා" පසුගිය දිනක ගුවන් විදුලියෙන් ප්‍රචාරය වූ ගීතයකින් මගේ මතකයට නැගෙන කොටසකි, මේ. ගීත රචකයා හෝ සංගීතයා හෝ ගායකයා පිළිබඳව අවධානය යොමු කරනවාට වඩා මගේ සිත යොමු වූයේ එම ගීත ඛණ්ඩයෙන් මතු වූ අරුතටයි. මම මනසින් විශාල සංස්කෘතික පසුබිමක, අතීත හා වර්තමාන සමාජ පසුතලවල සැරිසැරුවෙමි. එම සිතුවිලි සමුදාය පාදක කරගනිමින් 'විවිධ' ලිපි මාලාවේ මෙවර ලිපිය සකස් කිරීමට මට සිතුණි.

සිංහල සමාජය තුළ එදා මෙදාතුර ප්‍රචලිතව පවත්නා ජන කියමන් ගැන අපි ඉහතදී ද සඳහනක් කළෙමු. සිංහල සංස්කෘතිය උරුම කරගත්, සමාජය සතුව පවතින ප්‍රස්ථාව පිරුළු, අප්තෝපදේශ, පොදුවේ ගත් විට ජන කියමන් අතර අසීමිත යෙදුම් සංඛ්‍යාවක් අපට හමු වෙයි. "අඹු සැමි දබරය බත ඉදෙන තුරුය" යන යෙදුම එදා සමාජයේ අපි නිතර දෙවේලේ ශ්‍රවණය කර ඇත්තෙමු. වත්මන් ශ්‍රී ලාංකික සමාජයේ ද විටින් විට මෙය අසන්නට ලැබුණද ඊට හාත්පසින් වෙනස් අදහස් ද අපට ශ්‍රවණය කරන්නට ලැබේ.

# "අඹු සැමි දබරය බත ඉදෙන තුරු ?"

පසුගිය දා පුවත්පතක පළ වූ කෙටි ලිපියක, එහි කර්තෘ, මනෝවිද්‍යා උපදේශක (විශ්‍රාමික) මේජර් සුසන්ත ද සිල්වා මහතා මාතෘකාව ලෙස යොදා තිබුණේ "බත්හැළි දහසක් ඉදුණද නොනිවෙන ගෙදර අඬදබරය" යනුවෙනි. මෙම මාතෘකාව කියවූ සැණින් කෙනෙකුගේ සිතට නැගෙන්නට ඉඩ ඇත්තේ අද සමාජය තුළ පවුල නැමැති සමාජ ඒකකය සම්බන්ධයෙන් උද්ගත වී ඇති ශෝචනීය තත්වයකි. එදා සමාජය අපේක්ෂා කළේ සැමියා සහ බිරිඳ අතර ඇති වන අසමගිකම්, මතභේද, වාද විවාද යනාදියෙන් මතුවන අසතුට, සිත් වේදනාව කළකිරීම් යනාදිය කල් නොයවාම සංසිඳෙන බවයි. උක්ත ප්‍රස්තාව පිරුළෙන් මතු වන වාච්‍යාර්ථය ද එයයි. නිවසක සැමියා බිරිඳ කිසියම් හේතුවක් නිසා සණ්ඩු සරුවල් ඇති කරගත්තද, බිරිඳ විසින් සූදානම් කරනු ලබන කෑම වේල, සංකේතාත්මකව සලකා බැලුවහොත් පිසිනු ලබන බත් හැළිය කවුරුනුත් එකතුව බෙදා හදාගෙන අනුභව කළ පසු ඒ සියලු අසමගිකම්, අසතුට, සිත් තැවුල යනාදිය දුරු වී යළිත් පවුලේ සාමාජිකයන් අතර, විශේෂයෙන්ම අඹු-සැමි දෙදෙන අතර සතුට, සාමය හා ආදරය මතු වන බව මෙම පිරුළෙන් ගම්‍යමාන වන අරුතයි. විශේෂයෙන්ම එක වහල යට ජීවත් වන, එකම පවුලේ සාමාජික සාමාජිකාවන් අතර සාමය, නිරන්තරායන්ම අපේක්ෂා කරන ලද්දකි. එවන් සාමයන් නිවසක් තුළ පවත්වා ගැනීමට නම් සැමියා හා බිරිය අතර ආදරය, සෙනෙහස, විශ්වාසය හා සුහදතාවය පැවතිය යුතුය. ස්වාමිභාර්යා දෙදෙනකු අතර පවතින අන්‍යෝන්‍ය විශ්වාසය හේතු කොටගෙන, ඔවුනොවුන් අතර ඇතැම් විටක හෝ ඇති වන අසමගිකම් සැබවින්ම තාවකාලිකව මතු වී ඉක්මනින්ම සමථයකට පත් වී යළි සමගිය ඇති වන තත්වයක් උදා විය යුතුය.

සුසන්තද සිල්වා මහාතාගේ ඉහත සඳහන් කළ කෙටි ලිපියෙන් පළ කෙරෙන අදහස් අපගේ මාතෘකාව තවත් අතකට යොමු කරවන්නකි. මනෝවිද්‍යා උපදේශකවරයකු වශයෙන් ඔහු ලද අත්දැකීමක් ඇසුරෙන් ඔහු මෙම මාතෘකාවට තවත් පැත්තක් සම්බන්ධ කර ලයි. විද්‍යාව හෝ වෛද්‍ය විද්‍යාව අද මෙන් දියුණු නොපැවති එදා සමාජයේ අඹු-සැමි අඬදබරය කවර හේතු සාදක මත පදනම් වුවද සමාජ පසුබිමෙන් ලද අනුග්‍රහය නිසා වැඩි අපහසුවකින් තොරව ඒවා විසඳී ගොස්, ඉදුණු බත් හැළිය හවුලේ බෙදා හදා ගෙන අනුභව කොට නින්දට යන්නට අදා ජනතාවට හැකි වන්නට ඇත. එසේ වුවද නූතන සමාජය තුළ දිස් වන සංකීර්ණ ස්වාභායන් හේතු කොටගෙන මෙවන් පවුල් අවුල්වලට පාදක වන විවිධ කාරණා තිබෙන්නට පුළුවන. එබඳු විශේෂ අවස්ථාවලදී මනෝවිද්‍යාඥයින්, උපදේශකවරුන්, වෛවද්‍යවරුන් ආදීන් මූලිකත්වය ගැනීමෙන් එබඳු ගැටලු නිරාකරණය කරගන්නට හැකි වනු ඇත.

කෙසේ නමුදු. අපගේ විශේෂ අවධානය යොමු වන්නේ සරල සමාජ ප්‍රශ්න හෝ වෙනත් හේතු කාරකයන් මුලකොට ගෙන අඬදබර සිදු වීමෙන් පවුල්වල ව්‍යාකූල තත්වයන් ඇති වීමේ ප්‍රවනතාව නූතන ලෝකය පුරාම දක්නට තිබීම ගැනයි. මීට කලකට පෙර ඇමෙරිකානු සමාජයේ දික්කසාද වීමේ ප්‍රතිශතය ගැන සොයා බැලූ පර්යේෂකයන්ගෙන් ප්‍රකාශ වූයේ විවාහ වන අයගෙන් සියයට හැටක්ම දික්කසාදයට යොමු වන බවත් එවැන්නන් දෙවැනි විවාහයක් කරගත්තද එයිනුදු ඒ හා සමාන ප්‍රතිශතයයක් යළි දික්කසාද වන බවයි. ඇතැම් ප්‍රාන්තවල මෙය සියයට හැත්තෑපහක් තරම් වන විශාල ප්‍රතිශතයක් ගැන ද අසන්නට ලැබිණ. කවර රටක වුවද අද මෙබඳු තත්වයන් උදගත වී තිබීම පුදුමයක් නොවේ.

ශ්‍රී ලංකාව විෂයයෙහි ගෙන බලන විට අපේ වැඩිහිටියන් සිතූ පැතූ ආකාරයට වඩා හාත්පසින් වෙනස් ලෙස විවාහය ගැනත්, පවුල් ජීවිතය ගැනත් සිතන්නට යොමු වනන්න අද බහුලව සිටින බව අමුතුවෙන් කිව යුතු නොවන තරම්ය. වත්මන් ශ්‍රී ලංකාව තුළ කාන්තාව කොතරම් නම් ඉදිරියට ගොස් ඇද්ද යන්න පැහැදිලිවම දැකගත හැකිය.දේශපාලනය වැනි ක්ෂේත්‍ර හැරුණු විට අධ්‍යාපනය, පරිපාලනය, නීති ක්ෂේත්‍රය, ඉංජිනේරු ක්ෂේත්‍රය ආදිය ගැන බලන විට කාන්තාවන්ගේ අතිශය සවිබල ගැන්වීමක් මෙන්ම ඔවුන් පෙරටුවට ගොස් ඇති බවක් ද දැකගත හැකිය. එසේ තිබියදීත් නිවස තුළදී ස්වාමිපුරුෂයන්ගේ දැඩි පාලනයට හා අණසකට යටත්ව තම ස්වාධීනත්වයට කිසිදු ඉඩක් නොලබන අවාසනාවන්ත කාන්තාවන් ද සිටින බව නොකියාම බැරි තරම්ය. ඇතැම් විට ගෘහස්ථ හිංසනයෙන් බැට කන ගැහැනියක් තම දුක් ගැනවිල්ල ප්‍රකාශ කර නීතිය මගින් රැකවරණයක්, සහනයක් ලබාගන්නට අදාළ ස්ථානයකට ගිය විට උක්ත ප්‍රස්ථාව පිරුළ උපුටා දක්වමින් ආපසු ගෙදර ගොස් හොඳින් ඉන්නැයි උපදෙස් දී යවන ඇතැම් ආයතන හා ඇතැම් පුද්ගලයන් ගැන ද අපට අසන්නට ලැබේ. එක් අතකින් බලන විට මෙය පොදු සමාජය කෙරෙහි යහපත් ප්‍රාර්ථනාවෙන් ගනු ලබන ක්‍රියා මාර්ගයක් ලෙස කෙනෙකු අර්ථ දක්වන්නට ඉඩ ඇත. එසේ වුවද ස්වාමිපුරුෂයකුගේ දැඩි අකාරුණික තත්වයකින් අසීමිත ලෙස බැට කමින් අන්ත අසරණ අඩියකට වැටෙන ගැහැනියකට මෙවන් සැලකීමක් හෝ ප්‍රතිචාරයක් කෙසේ නම් දරා සිටිය හැකිද ?

මෙලෙසින් විවිධ අංශ දෙස පුළුල්ව අවධානය යොමු කරන විට එදා කාන්තාව ලද සදුපදේශය අද එලෙසින්ම ක්‍රියාත්මක වීම කොතරම් දුරට සිදුවේද යන්න දෙවරක් නොව කිහිප වරක්ම සිතා බැලිය යුතු තත්වයකට පත් වී ඇත්තා සේය.

ශ්‍රී ලාංකික සමාජය මෙන්ම ජපන් සමාජය ද යහපත් පවුල් පරිසරයක් නියත වශයෙන්ම අපේක්ෂා කළ හා අදටත් එසේ කරන සමාජයකි. අප සතු අනේකප්‍රකාර ජන කියමන් මෙන් ජපන් ජනතාව සතුව ද ඇත්තේ විශාල සංඛ්‍යාවක් වන එවැනි යෙදුම්ය. ඒ අතර අපට හමු වන, "ෆුෆු ගෙන්ක ව ඉනු මො කුවනු" යන යෙදුමත්, "ෆුෆු ගෙන්ක තො කිතකසෙ ව යොනගි ග සුරු" යන්නත් ජපන් සමාජය තුළ වුවද අඹු-සැමි දබරය අගය නොකරන්නක් බව, අනුමත නොකරන්නක් බව කියා පායි. මෙහි දැක්වූ පළමු යෙදුමෙහි වාච්‍යාර්ථය වනුයේ, "විවාහක යුවළක් අතර ඇති වන අඬදබරයක් සුනඛයකු පවා නොලසකා හරින බව" යි. දෙවැන්නෙන් කියවෙනුයේ, "ඇද ඇතිරිලිවලින් වෙන් කරන තරමට වඩා දෙනො අතර විරසකය පුළුල්ය." යන්නයි. මීට තවත් ලෙසකින් අරුත් දැක්වුවහොත් "පවුලේ අවුල් වියවුල් සහ උතුරු සුළඟ එක් අතකින් සමාන වෙයි. එනම් සන්ධ්‍යා භාගය වන විට සන්සුන් වීමයි."

සිංහල හා ජපන් ප්‍රස්තාව පිරුළුවල බොහෝ විට දක්නට ලැබෙන, අරුත අතින් සාමාන්‍යය මෙහිදී ද පැහැදිලි වෙයි. මේ කවර පිරුළකින් වුවද අවසානයේ ප්‍රකට වනුයේ අඹු-සැමි දබරය සිදු නොවිය යුතු, නොවැදගත් හා නොසලකා හැරිය යුතු දෙයක් බවත්, එය තාවකාලික සංසිද්ධියක් බවත්ය. පුළුප් ලෙස ගත් කල්හි, කවර සමාජයක වුව අපේක්ෂාව වනුයේ සමගිය, සමාදානය, ආදරය, කරුණාව හා එකමුතු බව සහිතව පවුල් මෙන්ම පොදු සමාජය ද පැවතිය යුතුය යන්නය. සමාජයක මූලික කේන්ද්‍රස්ථානය වන පවුල ඇතුළත සාමය පවතින විට එය පොදු සමාජය වෙතට ද පැතිරී යනු ඇත. එබැවින් අසමගයේ මූල බීජය එතැනින්ම ඉවත් කර දැමිය හැකි නම් පවුල්වල මෙන්ම පොදු සමාජයේ ද ස්ථාවරත්වය ආරක්ෂා වනු ඇත.

අඹු - සැමි අරගලයට එක් ප්‍රධාන හේතුවක් ලෙස සැකය ගත හැකිය. ශක්තිමත් පවුල් පදනමක් සඳහා අත්‍යවශ්‍ය වන අන්‍යෝන්‍ය විශ්වාසය කවර හේතුවක් නිසා හෝ බිඳ වැටී ගොස් සැකය නමැති බීජය රෝපණය වීමෙන් දිනෙන් දින එම තත්වය වර්ධනය වී යාමට ඉඩ ඇත. එදා සමාජය තුළ පුද්ගලයන් හුදකලා මූලික පවුල් ලෙස නොව විස්තෘත පවුල් නැතහොත් සම්බන්ධිත පවුල් ලෙස ජීවත් වීම දක්නට ලැබුණි. එබැවින් විවාහක යුවළකට සෙසු ඥාතීන්ගෙන්, වැඩිහිටියන්ගෙන් දුරස් වී සිට තම සැකය, ගැටලුව තුළම මිරිකෙමින් වේදනා විඳින්නට සිදු නොවිණි. බිරියකට මතු වන ගැටලුකාරී තත්වයක් තම ඥාතීන්, වැඩිහිටියන් සමග සාකච්ඡා කොට විසඳුමක් හෝ මානසික සුවයක් ලබාගන්නට එදා සමාජ පසුතලය ඉඩ හසර ලබාදුන්නේය. එහෙත් වර්තමානයේදී මූලික පවුල් ඇතළත ස්වාමි-භාර්යා-දූදරු යන පාර්ශ්ව තුන පමණක් එක්ව වසන, පිටතින් බොහෝ විට ආවරණය වූ නිවාසයක, සීමිත ඉඩක ගෙවන ජීවිතයේදී අඹු-සැමි ප්‍රශ්න වුව විසඳ ගැන්මට නොහැකිව ඒවා දුර දිග යන්නට ඉඩ ඇත.

අනික් අතින් බලන විට එදා ගෘහණිය තම සැමියා ඇතුළු පවුලේ සාමාජිකයන්ගේ අවශ්‍යතා ඉටු කරමින් නිවස තුළදීම අවශ්‍ය ආහාර පාන සපයා, සකසා ගනිමින් පවුල් ජීවිතය ගෙවීමට වාසනාවන්ත වූවාය. වත්මන් කාන්තාවගේ කාර්යබහුල දෛනික ජීවිතය තුළදී නිවැසියන්ට අවශ්‍ය ආහාරපාන හැම විටම සියතින්ම සකස් කර දෙන්නට ඉඩ හසර නොතිබෙන්නට පුළුවන. දිවා ආහාරය කාර්යාලයේදී ලබා ගන්නා ඔවුන්ට රාජකාරී නිමා වී ආපසු එන අතර මගදී යමක් ගෙනැවිත් රාත්‍රී ආහාරවේල පිරිමසා ගන්නට සිදු වීම අරුමයක් නොවේ. ඊට අමතරව කවුරු කවුරුනුත් තම තමන්ගේ කාර්යයන්හි නියැලෙමින් සිට, ඉඩ ලද විටකදී මේසයට අවුත් එහි ඇති යමක්, තනිවම හිඳ අනුභව කරන්නට යොමු වන අවස්ථා ද බහුලය. රූපවාහිනිය නැරඹීමේ අද පවතින ප්‍රවණතාව අනුව මව්පියන් හා දූ දරුවන් රූපවාහිනි තිරය දෙස බලාගෙන යාන්ත්‍රිකව මෙන් පිඟානේ ඇති කුමක් හෝ වේවා කටට දමා ගන්නට සිදු වන ආකාරය ගැන ද අද බෙහෙවින් කතා බහට ලක් වී ඇත.

මෙවන් සංකීර්ණ හේතු සාදක අනුව වත්මන් පවුල එකට එකතුව, සමගියෙන් අදහස් උදහස් සමඟ ආදරය සෙනෙහස ද සමව බෙදා හදාගනිමින් ජීවිත ගෙවීමෙන් දුරස්ව යන බවක් දැක ගන්නට ඇත. එවන් තත්වයක් අනුව එකිනෙකාගේ සිත්වල මතු වන අසන්තෝෂය, කළකිරීම හා වේදනාව සමනය වනු වෙනුවට දිනෙන් දිනම ඒවා වර්ධනය වෙමින් ඔඩු දුවමින් ගොස් අසාධ්‍ය වන තත්වයකට පත් වන අවස්ථා අපට දැකගත හැකිය.

මෙවන් ඛේදජනක තත්වයක් සමාජය තුළ උද්ගත වී තිබියදී වුව අදත් ශ්‍රී ලංකාවාසීන් දෙමාපිය - දරු අඹු - සැමි සුහද සම්බන්ධතා වර්ධනය වන සේ ගෙවන ශක්තිමත් පුවල් ජීවිත ද විරල නොවේ. එවැනි තත්වයන්ගෙන් අපට ලද හැකි ආදර්ශ මොනවාදැයි සිතා බැලීම වටී. පවුල තුළ සැමියකුට බිරඳ යනු දෙවැනි මවකි, හිතවතියකි. තම ජීවිතයේ අවශ්‍යතා සපාරාලන හා සපුරාගන්නට සහාය වන ආදරබර සහකාරියකි. සුනිල් එදිරිසිංහ ගයන රසවත් මෙන්ම අරුත් බර වූ ද ගීතයක් මෙහිදී අපට සිහිපත් කරගත හැකිය.



"කලේ පැන් ඇත නැවුම් රහ නැත - මොකද මන්දා ළිඳට වූයේ
පුළුස්සාගත් රොටිය කර වී - මොකද මන්දා ලිපට වූයේ
හදාගත් ලුණු මිරිස රහ නැත - මොකද මන්දා දිවට වූයේ

සැලේ ගහ කොළ සුළඟ ඇත එද - සිහිල කොයි අත ගියා දෝ
කෝල බව මුසු සිනා හඬ ඇත - සවන් බිහිරිව ගියාදෝ
පුරුදු නිවහන නුහුරු වී නම් - කාට මේ ගැන කියන්නෙම්
කාට මේ ගැන කියන්නෙම් මම - බිරින්දෑ නෑ ගම් ගොහින්"

(ගායනය - සුනිල් එදිරිසිංහ)

රොටියක් පුළුස්සා ගත්ත ද එහි රසක් නැත. ලුණු මිරිසක් තලාගත්ත ද එයත් රස නැත. කළේ පැන් ඇතත් එහි පුරුදු රසය නැත. මේ ආදී ඇබැද්දි සැමියකුට සිදු වී ඇත්තේ බිරිඳ

35 වන පිටට